




## සිසිර දිසානායක

''මේ මොකද මේ....?'' අපි ඇඳ උඩම සීරුවෙන් හිටගෙන ඉන්න පින්සල දැකලා පන්හිඳ තිගැස්සුණා. පින් පන්ට මේසය උඩ තියෙන රේඩියෝ එක ඇවිත් පෙන්නුවා.

'ආ මේ ජාතික ගීය වාදනය වෙනවා. ඒකයි මේ.'' ලංකාවේ පනස් නවවැනි නිදහස් උත්සවය ගැන හැම ගුවන් විදුලියක්ම වාගේ උනන්දු වෙලා තිබුණා.
''මට කිත්තා මතක් වුණා'' ජාතික ගීය වාදනය ඉවර වුණාම පන් පින්ට කිව්වා.
''කිත්තා කිව්වේ....?''
''ඇයි දන්නේ නැද්ද අර ඩ්‍රම්ස් ගහන කිත්තා? දිග කොණ්ඩයක් එහෙම වවාගෙන ඉන්නේ. ජාතික ගීය ඩ්‍රම් සෙට් එකෙන් වාදනය කරන කොට කිත්තට ඉබේම නැගිට්ටවෙනවා....''

ඒකට තමයි කියන්නෙ හැදිච්චකම කියලා. ඕවා ලෙයට කැවිලයි තියෙන්නෙ....' පින් කිව්වේ වචනවලට බර දාලයි. ''හැදිච්චකම, සංස්කෘතිය වගේ දේවල් බලෙන් දෙන්න බෑ. අනාදිමත් කාලයක් තිස්සේ පැවතගෙන එන වටිනා කියන සාරධර්ම එක්ක ඉබේටම හිත්වලට ඇතුල් වෙන හැඟීම් තමයි හැමදේටම මුල් වෙන්නෙ.

# අපි

පින් වෙලාවකට හරි පණ්ඩිතයි වගේ.
පසුගිය දවසක මේ රටේ ජාතික කොඩිය, ඉහේ ඉහේ බැඳගෙන දඟලන එක ගැන තිබුණ ආන්දෝලනය පන්ට සිහිවුණා. අපේ අය මෙහේ අයගෙන් වෙනස් වෙන්නෙ කොහොමද? පන් ට නිකමට හිතුණා. කවුද මේ අපි කියන්නෙ? පන් කොහොමත් 'මම'' වචනයට වඩා ''අපි'' වචනයට කැමතියි. එතන ලොකු හයියක් තියෙනවා. ''බදාගෙන කනවාට වැඩිය බෙදාගෙන කනවා නම් හොඳයි' කියලා පන් කියමනක් හදාගෙන තියෙන්නෙත් ඒ හන්දම වෙන්න ඇති.

පනස් නව වැනි නිදහස් උලෙල මෙල්බර්න් නුවර රාජතාන්ත්‍රික මට්ටමෙන් පවත්වන්න තීරණය කල වෙලාවේ මේ රටේ වගකිවයුත්තන් ඒකට තේමාවක් දුන්නා "Harmony" නැත්නම් 'සහජීවනය'' යි තේමාව කණ්ඩායම් වැඩ Team work ගැන වැඩමුළු work shops පවත්වන්න වෙලා තියෙන රටකට සංක්‍රමණය වෙලා ඉන්න ලංකාවේ අපිට මේක අලුත් දෙයක් ද? වෙලේ කමතේ පින්කම් පොලේදී, මංගල්ලයේදී, කොවිලේදී, මගුලෙදි -මරණයේදි අපට තියෙන අත්දැකීම්? පන් තමන්ගේ හිතට එන දේවල් ඒ හැටියටම නිදහසේ ලියාගෙන යන්න පටන් ගත්තා.

''ඇයි කැපිලි - කෙටිලි, පෙත්සම්, කේලාම්, පාවාදීම්, ඕපා දූප?' පින් ට්‍රැක් පනින්නයි හදන්නේ'' අපේ අය එකතු වෙන්නෙ තව කෙනෙකුව කපන්න....''
''නෑ... නැ.. එහෙම හිතන එකනම් වැරදියි. එකතු වෙලා කරන ලස්සන වැඩ කොච්චර තියෙනවාද?' පන් ටිකක් හිතට අරගෙන ආයෙත් ලියන්න ගත්තා.

ශ්‍රී ලංකා කොන්සල්වරයා (Consulate of Sri Lanka) වන රෝඩ්නි අරඹවෙල සහ committee for sri lanka හි ලේකම්වරිය වන ශ්‍රියා ජයවර්ධන යන මහත්ම මහත්මීන්ගේ සහයෝගයෙන් මාලනී ජයසිංහ මහත්මිය සංවිධානය කළ ඉහළ කී උත්සවය මෑතක දී දක්නට ලැබුණ කදිම එකමුතුවක්.



උත්සවය සමාරම්භයේදී ශ්‍රී ලාංකේය ජාතික ධජය රැගෙන විත් ඔසවනු ලැබුයේත්, ආචාර විධි පවත්වනු ලැබුයේත් ඕස්ට්‍රේලියානු ජාතික Girl Guides දැරියන් විසින් ඉන් අනතුරුවයි. රට දැය වෙනුවෙන් දිවි දුන්නවුන් සඳහා විනාඩි දෙකක නිහඬතාවයක් රකිනු ලැබුයේ එම කටයුතු සම්බන්ධීකරණය කරන ලද්දේ ඩොවීන් නඩරාජා සහ මොනිකා ලොව්ටන් මහත්ම මහත්මීන්, වීනිතා විජේරත්න මහත්මිය අනුදත් දැරියන් විසින් ගැයුණ ජයමංගල ගාථා මධ්‍යයේ ආරාධිතයින් වු Kingston city council හි නගරාධිපතිනිය වන Cr. Topsy Petchey, cranbourne හි පාර්ලිමේන්තු මන්ත්‍රී ජුඩ් පෙරේරා ප්‍රමුඛ පිරිස පොල්තෙල් පහන දල්වනු ලැබුවා.

සපැමිණි සිටි ආරාධිතයින්ගේ කථාවලින් අනතුරුව රංගන රණතුංග සහ අසංක යන ශිල්පීන්ගේ ගැටබෙර සහ යක්බෙර යුගල වාදනයෙන් ඇරඹි සංස්කෘතික ප්‍රසංගය ශ්‍රී ලංකේය මතුනොව ඕස්ට්‍රේලියානු හා ඉන්දියානු ශිල්පී ශිල්පිනියන්ගේ ද දායකත්වයෙන් අලංකාරක වූවා. රංගනයෙන් රශිකා කුලසිංහ, රංගන හා උදුම්බරා යුවල, මීනා එළන්කුමාරන්, දිල්හානි ද සිල්වා සහ අමා සිරිවර්ධන යන නර්තනවේදීන් නර්තන වේදිනියන් ප්‍රමුඛ සිසු සිසුවියන් ද කතෝලික ප්‍රසාංගික අංගයක් ඉදිරිපත් කරමින් ''මීඑර්කස් සැහකදඛ තැකකදඅියසව පා කණ්ඩායමක්ද තම තමන්ගේ නිර්මාණාත්මක කුසලතාවයන් වේදිකා ගත කළා. වේදිකා ආලෝකකරණයත් ශබ්ද පරිපාලනයත් උපා උපදාස සහ ප්‍රියන්ත ප්‍රනාන්දු මහත්වරුන් අතින්. වේදිකා පසුතල නිර්මාණය කරන ලද්දේ ජගත් ධර්මසේන මහත්මා. සියලු ග්‍රැෆික් වැඩකටයුතු වෙලින්ටන් මොල්ලිගොඩ කලාකරුවාන්ගෙන්. කථනය චතුර විජේතුංග හා මෙලනි අබේසිංහ, නිවේදක යුවලගේ හඬින් මෙකී නොකී සියලු අයට අමතරව වේදිකා පරිපාලනය සහය කටයුතු සංග්‍රහ කටයුතු වැනි දේට අත හිත දුන්නවුන් නාමිකව සටහන් කිරීමට අපහසු තරම්.

සංස්කෘතික පෙළහරේ විශේෂ අංගය වුයේ මෙනුවරන් අතින්ම නිමැවී, මෙනුවරනගේම නර්තනයන් මධ්‍යයේ මෙනුවරන් හඬින් ම ගැයුණ තේමා ගීයයි. කුඩා දරු දැරියන් පෙළක්, නව යෞවනියන් කැළක්, කාන්තාවන් සමුහයක් සහ තරුණයින් පිරිසක් වෙන් වෙන් වශයෙන් හා ඒකරාශිව ගායනා කළ ගීයේ තනුව සංගීතය හා මෙහෙයුම තරුණ සංගීතවේදී රොහාන් නෙත්සිංහයන්ගේ. සමූහ ගායන රටා සකස් කරමින් පුහුණු කරනු ලැබුයේ වාසනා වීරකෝන් සංගීතාචාර්යවරයායි. අපරදිග නාදරටා නිර්මාණය වුයේ චිත්‍රනී ඒකනායක, අසුන්තා කරුණාරත්න, චතු ජයසුරිය දැරියන්ගේ ද සහායෙන්. තිස්පස් දෙනෙකුගෙන් පමණ සමන්විත වුණ ගායන වෘන්දය සුදු ජාතික දැරියන්ගෙන්ද සපිරුණා. ගැටබෙර, යක්බෙර සමඟින් බටහිර තාලවාද්‍ය කට්ටලයේ රිද්මයට බටනලාවත් විදුලි සරපුවරත් ගිටාරත් සංගීතය මුසුකළා. පන් ලියවිල්ල හමාර කළේ ඔය විදියටයි.

ඒත් හිස්තන් කීපයකුත් ලියවිල්ලේ තියලා තිබෙන බවයි පේන්නෙ. ඔය කිව්ව තේමා ගීතය ලියන්න මාලනී ජයසිංහ අක්කාගෙන් ආරාධනා ලැබුවෙ පන්. තමන්ට ලැබෙන ඔය වාගේ ආරාධනා තමන්ටම අභියෝගයක් කර ගන්න පන් මුල් පද හතරේ හැම වචනයකම අග එළිසමය රකින්න සමත් වුණා. දෙවන කොටස ශබ්ද රසය නැංවෙන විදියටයි ලියවුණේ. වර්ෂ 1998 නිදහස් ස්වර්ණ ජයන්තිය වෙනුවෙන් ජාතික රූපවාහිනිය මගින් දියත් කරපු ආධුනික ගී රචනා තරගයෙන් ජග ගත්ත ගීතය පන්ගේ සිහියට ආවා. ''සාමයෙන් ඉන්න බැරි ඇයි'' කියන අදහසින් මව්බිමේදී ලියවුණ ඒ ගීය එච්.එම්. ජයවර්ධන සංගීතවේදියාගේ සංගීතයට ගායනය කළේ කරුණාරත්න දිවුල්ගනේ ගායන ශිල්පියා.
අද සාමය ඇති රටක එකමුතුව සහජීවනයෙන් ඉන්න අපි ගැන පන් ලිව්වේ ප්‍රධාන සෞන්දර්ය විෂයයන් තුනක් වන චිත්‍ර, නැටුම්, සංගීතය අංශවල එන අංග උපමා රූපක කරගෙන. පන්ගේ අදහස මාලනී අක්කා ඉංග්‍රීසියට පෙරලුවේ ගායනීය ගුණය අගේට රැකගෙන මේ කොටස්වලට යෙදුණා. තනුවට අනුව අන්තිම කොටසට ආයෙමත් පන් පද යෙදුවා. ද්‍රවිඩ භාෂාවෙන් ලියවුණ කොටස ලිව්වේ ගායනයටත් සහභාගී වුණ ඇන්ජලා සුන්දරලිංගම් දියණියයි. පන්ගේ පිහිටෙන් පින්ටත් පින් පෑදුණා. වේදිකා පසුතලයේ අදහස නිර්මාණය කරලා ජගත් ධර්මසේන සොහොයුරාට සහයෝගය දෙන්න. අනුවකට වැඩි මෙල්බර්න් නුවරුන් පිරිසක් එකට එකතු වෙලා කළ මේ සංස්කෘතිමය කටයුත්ත පන්ගේ, පින් ගේ විතරක් නෙවෙයි, හැමෝගේම අමන්දානන්දයට හේතුවක් වුණ බව නම් නොඅනුමානයි.

එක අරුනක ඇඳෙන සොඳුරු සිත්තමක් ය අපි
එක තනුවක ගැයෙන මියුරු ගීතයක් ය අපි
එක පදයක රඟන සුහුරු වත්නමක් ය අපි
එක උකුලක ඊනෙන සොයුරු දේශයක් ය අපි

පාට පාට එකතුවෙලා - නාද නාද එකතු වෙලා
තාල තාල එකතුවෙලා - දිගු දුනු එකතු වෙලා

දුකට සැපට එකට සිටින ලෝකයක් ය අපි
දුකට සැපට එකට සිටින විශ්වය ක් ය අපි

Let there be joy - In the colours
Black, white and mixed
Joy in the sounds of - Giggles, cries and prayers
Let us bond together - Hold hands forever
And dance to one melody
For we are one - We are one
We are in harmony !

நாங்கள் ஒற்றுமையாய் - ஒற்றுமையாய்
ஒன்றா இருக்கின்றோம் !

අපි එකමුවෙයි - එකමුතුයි
අපි සැම එකමුතුයි. !

---

10 වන පිටෙන්

මංගල වැනි චන්ද්‍රිකා හිතවාදීන් තැලුම් කන්නේද, රාජිත සේනාරත්න වැනි උග්‍ර චන්ද්‍රිකා විරෝධීන් ඇමතිකම් ලබන්නේද, මේ ප්‍රවණතාව තුළමය. කෙසේ වෙතත් මෑතක සිට මහින්ද යුධවාදී යැයි කියා හඬ නැගූ ''රාවය'' පුවත්පත චන්ද්‍රිකා මතුවේ යැයි යන බියෙන් මෙන අපූරු ලෙස මහින්දට පක්ෂපාතී පිලකට මාරු වී ඇත. එසේම සියලු පරණ අමනාපකම් අමතක කර ''ඉරුදින'' හා ''සන්ඩේ ලීඩර්'' නැවතත් චන්ද්‍රිකා මතුකරලීමේ උත්සාහයක නිරත වෙමින් සිටියි.

මෙම පසුබිම මත දෙමළ චින්තකයන් කියනා ආකාරයේ මෙය සිංහල මහ ජාතියේ කුමන්ත්‍රණයක්ද? පමණක ලෙසට නොව සලකා බැලිය යුත්තේ, දෙමළ ජාතිකයන්ද, ඉල්ලා සිටිනා ප්‍රජාතන්ත්‍රවාදී ශෛලියේ භාවිතයක් ලෙසය. ප්‍රභාකරන් තමන්ට එරෙහි දෙමළ නායකයන් මරා දමන්නේද, මේ සන්දර්භයේම අනෙක් පැත්ත භාවිතයට ගැනීමෙනි. ''මේ සියලු පාඩම් මහින්දට ප්‍රභාකරන් පමණක් නොව පුවත්පත් වලටද කියා දුන්නේ මැකියාවේලි''ය.

ඔබ කනස්සල්ලෙන් ද..? පසුතැවිල්ලෙන් ද..?
ඔබට විශ්වාසදායක උපදේශක සේවාවක් අවශ්‍යයි ද?

එසේ නම්
ඔස්ට්‍රේලියානු උපදේශක සංගමයේ ලියාපදිංචි සාමාජිකාවකගෙන්
එම උපදේශක සේවය ලබාගැනීමට දැන්අවස්ථාව ඇත

- සිංහල හා ඉංග්‍රීසි භාෂා දෙකෙන්ම සේවය
- පහසු අයකිරීම්

ශ්‍රී ලාංකික ඔබ සඳහා විශේෂයි

MPS Counselling Service
Shiromi Perera (MACA)
Mast. Couns, Grad Dip Couns, BSc

CLINIC
20/215 Betula Ave
Mill Park VIC 3082
Tel: (03) 9436 6965
Mob: 0448 829 905
Email : shiromi.p@optusnet.com.au

ACA AUSTRALIAN COUNSELLING ASSOCIATION
REGISTERED MEMBER OF THE AUSTRALIAN COUNSELLING ASSOCIATION

VCE
Chemistry & Biology
&
Junior Levels Maths
Tuition
(Northern Suberbs)
offered by a
Qulified & Experienced Teacher

Call Sandya on 9437 7801
Mobile 0402 503 398